# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 25.බැංකු

කොවිඩ්-19 රෝග තත්වයට ප්‍රතිචාර වශයෙන් මෙම අවස්ථාවේ, දුරස්ථභාවය පවත්වා ගැනීමට හැකිවන පරිදි ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව පාලනය කළ යුතුය.

නිශ්චිත පණිවිඩ / උපදෙස්

බැංකු කළමනාකාරීත්වය

- කොවිඩ්-19 රෝග පැතිරීම පාලනය සඳහා පෙර-සූදානම් වීමේ සැලැස්මක් තබා ගැනීම. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු සුදුසු නිලධාරියෙකු පත් කිරීම සහ නව ජීවන රටාවට කාර්ය මණ්ඩලය යොමු කිරීම
- සබන් යොදා අත් සේදීම සඳහා පාදයෙන් ක්‍රියා කරන/සංවේදක මඟින් ක්‍රියාත්මක වන සින්ක් එකක් දොරටුව අසළ ලබා දෙන්න
- සේවකයින් සඳහා ප්‍රමාණවත් පුද්ගලික ආරක්ෂක උපකරණ ඇති බව සහතික කිරීම සහ ඒවා නිවැරදිව භාවිතා කිරීම පිළිබඳව ඔවුන් පුහුණු කිරීම
- සේවකයින්ගේ සෞඛ්‍යය පිළිබඳව දිනපතා විමසීමේ ක්‍රමයක් ඇති කරන්න. (උණ සහ කැස්ස / සෙම්ප්‍රතිශ්‍යාව වැනි ශ්වසන රෝග ලක්ෂණ විමසන්න) සහ ඔවුන්ට සුදුසු වෛද්‍ය උපදෙස් ලබා ගැනීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කරන්න
- මුදල් කවුන්ටරයන්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, පොදු දුරකථන, ෆැක්ස් යන්ත්‍ර, ඇඟිලි සලකුණු ස්කෑනර් යන්ත්‍ර, මේස සහ පොදු ආසන පිරිසිදු කර විෂබීජහරණය කිරීම
- පාවිච්චි කරන ලද මුහුණු ආවරණ සහ ටිෂූ කඩදාසි ඉවතලීම සඳහා, පාදයෙන් විවෘත කළ හැකි පියන සහිත බඳුන් ලබා දීම
- පෝලිම් ඇති ස්ථානවල මීටරයක පරතරය පවත්වාගතහැකි පරිදි බිම් සැලැස්ම සකස් කර සලකුණු කිරීම.
- වායු සමීකරණ / සිවිලිම් විදුලි පංකා මධ්‍යස්ථ වේගයකින් ක්‍රියාත්මක කරන්න
- සතියකට වරක් වායුසමීකරණ යන්ත්‍රවල පෙරහන් සෝදන්න / පිරිසිදු කරන්න. සති දෙකකට වරක් සිවිලිම් විදුලි පංකා වල පෙති පිරිසිදු කරන්න
- වායු සමීකරණවල ඝනීභවනය වූ ජලය ආරක්ෂිතව ජලාපවහන පද්ධතියට මුදා හරින්න.
- එදිනෙදා බැංකු කටයුතු සඳහා විද්‍යුත්-බැංකුකරණය හෝ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතා කිරීම පිළිබඳව සලකා බැලීමට පාරිභෝගිකයින්ට නිර්දේශ කිරීම
- වරකට පරිශ්‍රය තුළ රැඳෙන ගනුදෙනුකරුවන් සංඛ්‍යාව අවම කරගත හැකි පරිදි බැංකුව විවෘතව තබන වේලාවන් නැවත සකස් කිරීම
- විදුලි සෝපානයක් තිබේ නම්, ආරක්ෂිත දුරක් පවත්වා ගැනීම සඳහා වරකට ගමන් කරන පුද්ගලයන් ගණන සීමා කිරීම සඳහා බිමෙහි ස්ථාන සලකුණු කරන්න
- ගනුදෙනුකරුවන් සඳහා අත් සේදීම සහ වියළීම සඳහා පහසුකම් දොරටුව අසළ ස්ථානගත කිරීම.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම ආයතන ප්‍රධානියාගේ / කළමනාකරු ගේ වගකීම වේ

සේවක / කාර්ය මණ්ඩලය

- නිසි පරිදි මුහුණු ආවරණ සහ අනෙකුත් පුද්ගලික ආරක්ෂක උපකරණ පැළඳීම
- කිසිවිටෙකත් මුහුණ අතින් නොඇල්ලීම සහ මුහුණු ආවරණය පැළඳ සිටින විට එය ස්පර්ශ නොකිරීම
- කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, උගුරේ අමාරුව, හුස්ම ගැනීමේ අපහසුතාවය වැනි ශ්වසන රෝග ලක්ෂණ හෝ උණ ඇති වුවහොත් රැකියාවට නොපැමිණීම
- පරිශ්‍රයට ඇතුළු වීමට පෙර, පරිශ්‍රයෙන් පිටත්ව යාමට පෙර සහ රැකියාවෙහි යෙදී සිටින අතරතුරත් නිතරම, අවම වශයෙන් තත්පර 20 ක් වත් සබන් යොදා දෑත් සේදීම

- ඇඟිලි සලකුණු ස්කෑනරය භාවිතා කිරීමෙන් පසු සනීපාරක්ෂක දියර යොදා දෑත් පිරිසිදු කරගැනීම.
- සෑම විටම කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමජිකයින් සහ ගනුදෙනුකරුවන් සමග මීටරයක පරතරයක් පවත්වා ගැනීම.
- ජංගම දුරකථන සහ පෑන් එකිනෙකා සමග හුවමාරු කර භාවිතා නොකිරීම.
- අත් ඔරලෝසු, ආභරණ වැනි අත්‍යවශ්‍ය නොවන ආයිත්තම් භාවිතා නොකිරීම.
- දුරස්ථභාවය පවත්වාගතහැකි සුබපැතුම් ක්‍රම පමණක් අනුගමනය කිරීම.

පාරිභෝගිකයින්

- මුහුණු ආවරණ නිසි ලෙස පැළඳ සිටීම සහ එය පැළඳ සිටියදී මුහුණු ආවරණය හෝ මුහුණ ස්පර්ශ නොකිරීම.
- කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, උගුරේ අමාරුව, හුස්ම ගැනීමේ අපහසුතාවය වැනි ශ්වසන රෝග ලක්ෂණ හෝ උණ ඇතිනම් බැංකුවට නොපැමිණීම.
- බැංකුවට ඇතුළුවීමට පෙර සබන් යොදා දෑත් සේදීම / සනීපාරක්ෂක දියර මගින් දෑත් පිරිසිදු කරගැනීම.
- සෑම විටම සියළුදෙනා සමග මීටරයක පරතරයක් පවත්වා ගැනීම.
- තමාගේ භාවිතය සඳහා පෑනක් රැගෙන යාම.

නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පිළිවෙල:

- පෝස්ටර්, ඉලෙක්ට්‍රොනික තිරවල වීඩියෝ, පොදු ඇමතුම් යන්ත්‍ර හරහා නිවේදනය කිරීම් සහ දැන්වීම් පුවරු.
- සෞඛ්‍ය අමාත්‍යංශයේ; පාරිසරික සෞඛ්‍ය, වෘත්තීය සෞඛ්‍ය සහ ආහාර සුරක්ෂිතතා අංශය මගින් සවිස්තරාත්මක මාර්ගෝපදේශයක් ලබා දී ඇත.
  ඒ සඳහා අන්තර්ජාල පිවිසුම;
  http://www.eohfs.health.gov.lk/occupational/images/2020/Workplace_COVID_guideline_for_web_20200320_si.pdf



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.